මුස්ලිම්වරයකු සතුව යමක් තිබී, ඒ ගැන අන්තිම කැමැත්ත ඔහු අබියස ලියනු ලැබීමකින් තොරව රාත්රී තුනක් ගත කිරීම ඔහුට යුතු වන්නේ නැත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී. "මුස්ලිම්වරයකු සතුව යමක් තිබී,
ඒ ගැන අන්තිම කැමැත්ත ඔහු අබියස ලියනු ලැබීමකින් තොරව රාත්රී තුනක් ගත කිරීම ඔහුට යුතු වන්නේ නැත." අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසීය: අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මේ ගැන කළ ප්රකාශයට මම සවන් දුන්
දා පටන් මා සතුව අන්තිම කැමැත්ත නැතිව රාත්රියක් හෝ ගෙවී ගියේ නැත.
[صحيح] [متفق عليه]

මුස්ලිම්වරයකු සතුව සුළු ප්රමාණයෙන් වුව ද යම් අයිතිවාසිකමක් හෝ සම්පතක් හෝ තිබී, ඒ ගැන අන්තිම කැමැත්ත ඔහු අබියස ලියනු ලැබීමකින් තොරව රාත්රී තුනක් ගත කිරීම ඔහුට යුතු වන්නේ නැති බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දැනුම් දුන්හ. අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා මෙසේ පැවසීය: "අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මේ ගැන කළ ප්රකාශයට මම සවන් දුන් දා පටන් මා සතුව අන්තිම කැමැත්ත නැතිව රාත්රියක් හෝ ගෙවී ගියේ නැත."

http://sunnah.global/hadeeth/si/show/5831